දෙපාර්තමේන්තු චක්‍රලේඛ : 07/2025 2025.10.14 දින.

1. පළාත් ප්‍රධාන ලේකම් මඟින්,
පළාත් විෂයභාර අමාත්‍යාංශ ලේකම් මඟින්,
සියළුම පළාත් අධ්‍යක්ෂවරුන් ( සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව),
දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ දිස්ත්‍රික් පශු වෛද්‍ය නිලධාරි,
පශු වෛද්‍ය නිලධාරීන්

2. අධ්‍යක්ෂ (සත්ත්ව සෞඛ්‍ය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) මඟින්,
දිස්ත්‍රික් පශු විමර්ශන නිලධාරීන්

3. අධ්‍යක්ෂ (පශු පර්යේෂණ, පශු පර්යේෂණ ආයතනය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) මඟින්,
ක්ෂීර ඉංජිනේරු විශේෂඥ

**<u>කිරි එකතු කිරීමේ දාමයෙහි කිරි නිෂ්පාදනය, කිරි එකතු කිරීම, ප්‍රවාහනය සහ ප්‍රාදේශීය මට්ටමින් කිරි විකිණීම් හා සැකසීම සඳහා සම්මත ක්‍රමවේදයන් හා මාර්ගෝපදේශ</u>**

1992 අංක 29 දරන සත්ත්ව රෝග පනත, 1958 අංක 59 දරන සත්ව පනත හා ලෝක සත්ත්ව සෞඛ්‍ය සංවිධානයේ ප්‍රකාශිත ජෛව ආරක්ෂණ ක්‍රමවේදයන්ට අනුව කිරි වල ගුණාත්මක බව පවත්වා ගැනීමට හා රෝග පැතිරීම වැලක්වීම වෙනුවෙන් ඉහත චක්‍රලේඛය නිකුත් කෙරේ.
තවද, දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත චක්‍රලේඛ අංක 02/2022, අංක 02/2022(i) හා අංක 05/2025 ට වැඩිමනක් ලෙස නව චක්‍රලේඛය නිකුත් කෙරේ.
ඉහත අංක DAPH/07/2025 චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමට බලයලත් නිලධාරීන් වෙත මෙමගින් බලය ලබා දෙනු ලැබේ. එයට අදාල තොරතුරු ඇතුලත් මාර්ගෝපදේශ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පල කර ඇත.

1. **කිරි ගොවිපල වල සෞඛ්‍ය ආරක්ෂිත ලෙස කිරි නිෂ්පාදනය කිරීම**
   කිරි ගොවිපල්වල සෞඛ්‍ය ආරක්ෂිතව කිරි නිෂ්පාදනය සඳහා සම්මත ක්‍රමවේදයන් හා යහපත් සත්ත්ව පාලන පුරුදු මාර්ගෝපදේශ **<u>"ශ්‍රී ලංකාවේ කිරි ගොවිපල් සඳහා යහපත් සත්ව පාලන පුරුදු"</u>** ප්‍රකාශණයට අනුව කටයුතු කළ යුතු වේ.

2. **කිරි එකතු කිරීමේ දාමයෙහි කිරි එකතු කිරීම, ප්‍රවාහනය සහ ප්‍රාදේශීය මට්ටමින් කිරි විකිණීම් හා සැකසීම සඳහා සම්මත ක්‍රමවේදයන් හා මාර්ගෝපදේශ**
   කිරි ගොවිපලේ සිට කිරි නිෂ්පාදනාගාර හා විකුණුම් ස්ථාන වෙත කිරි එකතු කිරීම, ප්‍රවාහනය හා ප්‍රාදේශීය මට්ටමින් කිරි සැකසීම සඳහා සම්මත ක්‍රමවේදයන්, මාර්ගෝපදේශ, ලියාපදිංචි ක්‍රමවේදය හා පිරික්සුම් ලැයිස්තු **<u>"කිරි එකතු කිරීමේ දාමයෙහි කිරි එකතු කිරීම, ප්‍රවාහනය, සහ ප්‍රාදේශීය මට්ටමින් කිරි විකිණීම් හා සැකසීම සඳහා සම්මත ක්‍රමවේදයන් හා මාර්ගෝපදේශ"</u>** ප්‍රකාශණයට අනුව ක්‍රියාත්මක විය යුතු වේ.

3. **කිරි එකතු කිරීමේ දාමයට හා ප්‍රාදේශීය මට්ටමින් කිරි විකිණීම් හා සැකසීමට සම්බන්ධ ස්ථාන සහ පුද්ගලයින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම.**

කිරි එකතු කිරීම, ප්‍රවාහනය හා ප්‍රාදේශිය මට්ටමින් කිරි සැකසීම අදාල ස්ථාන සහ පාර්ශවයන් රජයේ පශු වෛද්‍ය කාර්යාලයේ ඇමුණුම 01 හි සඳහන් අයදුම්පත මගින් ලියාපදිංචි කර ඒ සඳහා සහතිකයක් ඇමුණුම 02 හි සඳහන් පරිදි නිකුත් කල යුතු අතර අදාල ලියාපදිංචි ලේඛණයක් පශු වෛද්‍ය කාර්යාල තුළ පවත්වාගෙන යා යුතු වේ.
තවද, ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය හා එයට අදාල පිරික්සුම් ලැයිස්තු අංක 2 හි සඳහන් ප්‍රකාශණයට අනුව ක්‍රියාත්මක විය යුතුවේ

4. **කිරි සැකසුම් කම්හල් වලට කිරි ලැබීම් හා ගබඩා කිරීම් අධික්ෂණය සහ උපදේශන ලබාදීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ,** පශු පර්යේෂණ ආයතනයේ කිරි තාක්ෂණ රසායනාගාරය මගින් ඉටුකල යුතුවේ.
අධික්ෂණය කිරීමේ ක්‍රමවේදය හා එයට අදාල පිරික්සුම් ලැයිස්තු අංක 2 හි සඳහන් ප්‍රකාශණයට අනුව ක්‍රියාත්මක විය යුතුවේ.

Hemal Abey

ආචාර්ය කේ.ඒ.සී.එච්. ඒ කොතලාවල,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්

| | | |
|---|---|---|
| 01. | ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය. | :- කරු.දැ.ගැ.ස. |
| 02. | අතිරේක ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය. | :- කරු.දැ.ගැ.ස. |
| 03. | අධ්‍යක්ෂ ජනරාල් (සෞඛ්‍ය සේවා) | :- කරු.දැ.ගැ.ස. |
| 04. | විගණකාධිපති | :- කරු.දැ.ගැ.ස. |
| 05. | අධ්‍යක්ෂ ජනරාල් ( ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය) | |
| 06. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් (සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) | :- කරු.දැ.ගැ.ස. |
| 07. | සියළුම අධ්‍යක්ෂවරුන් (සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) | :- කරු.දැ.ගැ.ස. |
| 08. | ප්‍රධාන ගණකාධිකාරි (සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) | :- කරු.දැ.ගැ.ස. |
| 09. | ප්‍රධාන අභ්‍යන්තර විගණක (සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) | :- කරු.දැ.ගැ.ස. |
| 10. | සභාපති - මිල්කෝ ආයතනය | :- කරු.දැ.ගැ.ස. |
| 11. | සභාපති - ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | :- කරු.දැ.ගැ.ස. |